# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

2023 ඔක්තෝබර්

සමාජීය විද්‍යා පීඨය

## ආර්ථිකවිද්‍යාව

## ආර්ථිකවිද්‍යා මූලධර්ම - **ECON 18214**

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. | කාලය : පැය 03 යි.

---

01. (අ) ආර්ථිකවිද්‍යා විෂයයෙහි ගතිකත්වය එහි විකාශය තුළින් සනාථ කරන්න. (ලකුණු 10)

(ආ) ආර්ථිකවිද්‍යා විෂයයෙහි විශ්ලේෂණ විධි මොනවාද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

02. (අ) ආර්ථිකවිද්‍යාවේ කේන්ද්‍රීය ගැටලුව වශයෙන් සලකනු ලබන්නේ කුමක්ද යන්නත් එයට විසඳුම් ලබාදෙන ආකාරයත් විස්තර කරන්න. (ලකුණු 10)

(ආ) නිදහස් වෙළෙඳපොල ආර්ථික පද්ධතියක වාසි සහ අවාසි මොනවාදැයි කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 06)

(ඉ) ආර්ථිකයක නිෂ්පාදන හැකියාව තීරණය කෙරෙන සාධක මොනවාද? (ලකුණු 04)

03. (අ) තරගකාරී වෙළෙඳපොලක 'X' නම් භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත ආකාර වේ යැයි සලකන්න.

$Qd = 720 - 4P$ හා $Qs = -120 + 2P$

i. මෙම වෙළෙඳපොලෙහි 'X' භාණ්ඩය සඳහා සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න. (ලකුණු 04)

ii. ඉහත සමතුලිතයේ දී වෙළෙඳපොල අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 04)

මෙම භාණ්ඩය නිෂ්පාදනය වෙනුවෙන් ඒකකයකට රුපියල් 15 බැගින් වන සහනාධාරයක් රජය විසින් ලබාදෙන්නේ යැයි සලකන්න.

iii. සහනාධාරයෙන් පසු ගැනුම්කරුවන් ගෙවන මිල කොපමණද? (ලකුණු 02)

iv. සහනාධාරයෙන් පසු සැපයුම්කරුට ලැබෙන මිල කොපමණද? (ලකුණු 02)

(ආ) උපරිම මිලක් පාරිභෝගිකයාට වාසි හා නිෂ්පාදකයාට අවාසි ගෙන දෙන්නේ ඇයිද යන්න රූපසටහනක් භාවිතයෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(ඉ) සමාජීය වශයෙන් අවගුණ භාණ්ඩයක මිල ඉල්ලුම් නම්‍යතාව -0.75 ක් වන අතර එකී භාණ්ඩ ඒකකයක මිල රුපියල් 1500 ක් වේ. මෙම භාණ්ඩ පරිභෝජනය 30% කින් අඩු කිරීමට රජයට අවශ්‍යතාවයක් පවතී නම්, එකී භාණ්ඩ ඒකකයක මිල කොපමණ විය යුතුද? (ලකුණු 04)

04. (අ) අඩුවන පරිමාණානුකූල ඵල සහ විචල්‍ය සාධකය හීනවන ඵල අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ) නිෂ්පාදන ආයතනයක අභ්‍යන්තර පිරිමැසුම් හා බාහිර පිරිමැසුම් මොනවාද යන්න උචිත නිදසුන් මගින් පෙන්වා දෙන්න. (ලකුණු 04)

(ඉ) පහත සඳහන් යුගල අතර වෙනස පහදන්න.

i. සාමාන්‍ය අයභාර වක්‍රය සහ ආන්තික අයභාර වක්‍රය
ii. ස්ථාවර සාධක පිරිවැය හා විචල්‍ය සාධක පිරිවැය
iii. සාමාන්‍ය පිරිවැය වක්‍රය සහ ආන්තික පිරිවැය වක්‍රය
iv. ප්‍රත්‍යක්ෂ පිරිවැය (Explicit Cost) සහ ආරෝපිත පිරිවැය (Implicit Cost)

(ලකුණු 02 බැගින්)

(ඊ) නූතන පිරිවැය න්‍යාය තුළ දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය "L" හැඩයක් ගනු ලබන්නේ ඇයිද යන්න පහදන්න. (ලකුණු 04)

05. (අ) පූර්ණ තරඟකාරී වෙළෙඳපොලක පැවතිය යුතු මූලික ලක්ෂණ මොනවාද? (ලකුණු 04)

(ආ) පාරිභෝගික ස්වාධිපත්‍ය යනුවෙන් කුමක් අදහස් කෙරෙන්නේ ද? (ලකුණු 03)

(ඉ) පූර්ණ තරඟකාරී වෙළෙඳපොලක ව්‍යාපාර ආයතන බිත්තර නිෂ්පාදනයේ යෙදෙමින් ආර්ථික අලාභ ලබමින් සිටින්නේ යැයි සලකන්න.

i. මෙම වෙළෙඳපොල තුළ බිත්තර මිල (P), ආයතනවල සාමාන්‍ය මුළු පිරිවැය (ATC), සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) සහ ආන්තික පිරිවැය (MC) රූපසටහනක් මගින් විස්තර කරන්න. (ලකුණු 05)

ii. වෙළෙඳපොල සමතුලිතයේ දී බිත්තර කර්මාන්තයේ සහ ආයතනයක් අතර පවත්නා සබඳතාව යෝග්‍ය ද්වි රූපසටහනක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 04)

(ඊ) තරඟකාරී නිෂ්පාදන ආයතනයක ආර්ථික ලාභය ශුන්‍ය වන බව දක්වන කොන්දේසි රූපසටහනක් මගින් විස්තර කරන්න. (ලකුණු 04)

06. (අ) ඒකාධිකාරී වෙළෙඳපොල මාදිළිය තුළ දක්නට ලැබෙන මූලික ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න. (ලකුණු 05)

(ආ) ඒකාධිකාරී වෙළෙඳපොලක සාමාන්‍ය අයබාර වක්‍රය (AR) හා ආන්තික අයබාර වක්‍රය (MR) අතර පවත්නා අන්‍යොන්‍ය සම්බන්ධතාව පහදන්න. (ලකුණු 05)

(ඉ) ඒකාධිකාරී ආයතනයක සැපයුම් වක්‍රය පිළිබඳ ඔබට කුමක් ප්‍රකාශ කළ හැකිදැයි යෝග්‍ය රූපසටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ඊ) ඒකාධිකාරියට එරෙහිව 'සමාජ සුබසාධන හානිය' පිළිබඳ අදහස් දක්වන්නේ මන්ද යන්න යෝග්‍ය රූපසටහනක් මගින් පහදන්න. (ලකුණු 05)

07. (අ) වානිජ බැංකු පද්ධතියේ මුදල් මැවීමේ විභවතාව කෙරෙහි බලපෑ හැකි සාධක මොනවාද? (ලකුණු 05)

(ආ) මුදල් සැපයුම පාලනය කිරීම සඳහා මහ බැංකුව සතු විවිධ ශිල්පීය ක්‍රම මොනවාද? (ලකුණු 05)

(ඉ) වර්ෂ 2020 ට පසුව ශ්‍රී ලංකා මහ බැංකුව අනුගමනය කළ මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ කවරේද යන්නත් ඒවායෙහි ප්‍රතිඵල මොනවාද යන්නත් සඳහන් කරන්න. (ලකුණු 10)

08. (අ) ආර්ථිකයක සිදුවන සමස්ත නිෂ්පාදන ක්‍රියාකාරකම් බොහෝවිට දළ දේශීය නිෂ්පාදනය මගින් අධි තක්සේරුවක් හෝ ඌන තක්සේරුවක් වීමේ ඇති හැකියාව පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 08)

(ආ) විවෘත ආර්ථිකයක ජාතික ආදායම් චක්‍රීය ප්‍රවාහයෙන් සිදුවන කාන්දුවීම් සහ විදීම් මොනවාද යන්න රූපසටහනක් මගින් විස්තර කරන්න. (ලකුණු 06)

(ඉ) කල්පිත ආර්ථිකයක සමාහාර ආදායම රු. දශ ලක්ෂ 1000 සිට රු. දශ ලක්ෂ 2000 දක්වා වැඩිවන විට සමාහාර පරිභෝජන වියදම රු. දශ ලක්ෂ 1200 සිට රු. දශ ලක්ෂ 2000 දක්වා වැඩි වේ යැයි සිතන්න. මෙම තොරතුරු පදනම් කර ගනිමින් පහත දෑ ගණනය කරන්න.

i. ස්වායත්ත පරිභෝජනය
ii. ආන්තික පරිභෝජන නැඹියාව
iii. ඉතුරුම් ශ්‍රිතය

(එක් කොටසකට ලකුණු 02 බැගින්)

09. පහත දැක්වෙන <u>හතරක් (04)</u> නිර්වචනය කරන්න.

i. ජාතික ආදායම් ගුණකය
ii. ආන්තික පරිභෝජන නැඹියාව
iii. සංසරණ ප්‍රවේගය
iv. සමපේක්ෂණ චේතනාව
v. විනිමය අනුපාතය

(ලකුණු 05 බැගින්)

********************************